රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 2/89

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
විදෙහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1989 ජනවාරි මස 11 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් වැඩිකිරීම — 1987 දෙසැම්බර් මස 11 දිනැති අංක 387 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන

1989 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, 1988.5.16 දිනැති අංක.387 (iv) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත අංක.387 හා 1987.12.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 17 වැනි ඡේදය පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

" 17. වැන්දඹු, වැන්දඹු පුරුෂ/හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකර ගැනීම – අඩුකර ගැනීමේ ප්‍රමාණය පහත දැක්වෙන පරිදි වේ.

| 1988 නව ඒකාබද්ධ වැටුප් (වාර්ෂික) | |
|---|---|
| රු. 16,800 දක්වා | 3% (තුනයි) |
| රු. 16,801 සිට රු.25,800 දක්වා | 5% (පහයි) |
| රු. 25,801 සහ ඊට වැඩි | 6% (හයයි) . " |

02. මේ අනුව ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 12:2:1 වගන්තිය සංශෝධනය කෙරේ.

03. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

(සිරිල් ගමගේ)
වැඩබලන ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සු/-